# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.22 පැය 1245 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /806/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## 01. මාරක රිය අනතුරක් - උඩවලව පොලිස් වසම

2025.04.21 වන අද දින උදෑසන කාලයේ උඩවලව පොලිස් වසමේ උඩවලව තණමල්විල මාගර්යේ සමගි ක්‍රීඩා පිටිය ප්‍රදේශයේදී තණමල්විල දෙස සිට උඩවලව දෙසට ගමන් කළ යතුරු පැදියක් එම මාගර්යේම පාර හරහා මාරු වූ කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත.අනතුරින් කාන්තාව බරපතල තුවාල ලබා ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදි මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 81 ක් වූ තණමල්විල පාර, උඩවලව ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මෘතශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. යතුරුපැදියේ පැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර උඩවලව පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - දොරටියාව පොලිස් වසම

2025.04.22 වන අද දින අළුයම් කාලයේ දොරටියාව පොලිස් වසමේ කුරුණෑගල දඹුල්ල මාගර්යේ දම්බඩවත්ත විහාරයට හැරෙන හන්දිය ආසන්න ප්‍රදේශයේදී දඹුල්ල දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ මහින්ද්‍රා ලොරි රථයක් කුරුණෑගල දෙස සිට දඹුල්ල දෙසට ධාවනය වූ ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත.අනතුරින් දඹුල්ල දෙස සිට කුරුණෑගල දෙසට ගමන් කළ එක් පුද්ගලයෙකු මිය ගොස් ඇති අතර තවත් පුද්ගලයින් තිදෙනෙකු බරපතල තුවාල ලබා ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහල වෙත ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වන යටිගල්පොත්ත, ගලේවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘතශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. දොරටියාව පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**